අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල් කාර්යාලය
அத்தியாவசிய சேவைகள் ஆணையாளர் நாயகம் அலுவலகம்
OFFICE OF THE COMMISSIONER GENERAL OF ESSENTIAL SERVICES

**2025-දෙසැම්බර්-03 ප.ව.1.30**
**ගොනු අංකය : 2025/05**

# මාධ්‍ය නිවේදනය

**ශ්‍රී ලංකාව තුළ උද්ගතව ඇති ජාතික ආපදා තත්ත්වය හමුවේ සිය දායකත්වය ලබා දෙන පරිත්‍යාගශීලී ජනතාව වෙත සිදු කරන දැනුවත් කිරීම යි .**

ශ්‍රී ලංකාවට **තුළ උද්ගතව ඇති ජාතික ආපදා** තත්ත්වය හමුවේ පීඩාවට පත් තම සහෝදර ජනතාව වෙත පරිත්‍යාගශීලී ඔබසැම ලබා දෙන ආධාර සහ ඔවුන්ගේ ජනජීවිත යථාවත් කරදීම කෙරෙහි ඔබ දක්වන දායකත්වය සහ කැපවීම මෙම අවස්ථාවේ ගෞරවනීයව අගය කරන අතර එය මහත් වූ සහයෝගයක්ව ඇත.

ඔබගේ ආධාර නිවැරදිව, සම්පූර්ණ වගකීමෙන්, අත්‍යවශ්‍යම අයට ළඟා කරවන බව තහවුරු කිරීම අපගේ ප්‍රමුඛ වගකීමයි. එහෙයින් දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල තම බල ප්‍රදේශයේ පීඩාවට පත්වූ අපගේ සහෝදර ජනතාව සම්බන්ධව සහ ඔවුන්ගේ අවශ්‍යතාවයන් සම්බන්ධව නිවැරදි දත්ත පද්ධතියක් මේ වන විට යාවත්කාලීන කර ඇත.

ඔබ ලබා දෙන ආධාර නිවැරදි සහ කිසිදු අයෙකු මග නොහැරෙන ලෙසට ඔවුන්ගේ අවශ්‍යතාවයන්ට අනුව ගලපා ගැනීමට එකී දත්ත ඔබට උපකාරීවනු ඇත. එමඟින් කිසිදු ප්‍රදේශයක් හෝ පුද්ගලයෙකු මඟ හැරීමකින් තොරව සමබරව ක්‍රමවත් ආකාරයට සැබෑ අවශ්‍යතාවය ඇති අයට ආධාර ලබා දීමට අවස්ථාව සැලසෙන බැවින් ඔබගේ ආධාර දිස්ත්‍රික් ලේකම් කාර්යාල/ප්‍රාදේශීය ලේකම් කාර්යාල සමඟ සම්බන්ධීකරණය කරගෙන බෙදාහැරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්

Email Address: cg@esgovsl.com ; cg@ocges.gov.lk
අංක 150, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03, ශ්‍රී ලංකාව
எண். 150, ஆர்.ஏ. டி மெல் மாவத்தை, கொழும்பு 03, இலங்கை
No. 150, R.A. De Mel Mawatha, Colombo 03, Sri Lanka